SLAB
SRI LANKA ACCREDITATION BOARD

# ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

## වෙළෙඳ අමාත්‍යාංශය

# පුරප්පාඩු

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ (SLAB) පහත තනතුරු සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) ස්ථාපනය කරනු ලැබුවේ 2005 අංක 32 දරන පනතෙන් වන අතර අනුකූලතා තක්සේරු කිරීම හා සම්බන්ධ රසායනාගාර, වෛද්‍ය රසායනාගාර, පරීක්ෂණ ආයතන සහ සහතික කිරීමේ ආයතන, විලංගුකරණ සහ සත්‍යාපන ආයතන ප්‍රතීතනය සඳහා වග කියනු ලබයි. අනුකූලතා තක්සේරු සඳහා වන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වර්තමානයේදී වෙළෙඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, මගින් මෙහෙයවනු ලබන ප්‍රතීතන වැඩසටහන් සඳහා IAF MLA සහ ILAC MRA වෙත ඇතුළත් වී ඇත.

## සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය සහ පරිපාලන) - තනතුරු 01

### සුදුසුකම් :

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ගිණුම්කරණ / මූල්‍ය / ව්‍යාපාර පරිපාලන / කළමනාකරණ / වාණිජ්‍ය / ගිණුම්කරණ හෝ මූල්‍ය ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධියක් ලබා තිබීම

   සහ

   උපාධිය ලබාගැනීමෙන් අනතුරුව රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

2. පිළිගත් වෘත්තීමය වරලත් ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අන්තර්මධ්‍ය විභාගය සමත්ව තිබීම

   සහ

   රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කණිෂ්ඨ කළමනාකරු (JM-1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය : MM 1-1 – 2016 - LKR 53,175 - 10x1,375 - 15 x 1,910 = 95,575**

### වයස :

අපේක්ෂකයන් වයස අවුරුදු 22 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### ස්ථිර කිරීම :

මෙම කාණ්ඩයේ II ශ්‍රේණියට පත් කරන ලද බාහිර අයදුම්කරුවෙකු, වැඩ භාරගැනීමෙන් පසු වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ ඔහුගේ / ඇයගේ කාර්ය සාධනය සහ හැසිරීම සතුටුදායක නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩ ඉම සම්පූර්ණ කළ විට ඔහු / ඇය පරිවාස කාලයෙන් පසු තනතුරේ ස්ථිර කෙරෙනු ඇත. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ දැනටමත් ස්ථිර කළ තනතුරක සිට අභ්‍යන්තර තෝරාගත් අපේක්ෂකයෙකු එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

### බඳවාගැනීමේ පටිපාටිය :

ලිඛිත තරගකාරී විභාගයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## පරිපාලන නිලධාරි - තනතුරු 01

### සුදුසුකම් :

**බාහිර :**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය / වාණිජ්‍යය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර :**

1. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය කරන සුදුසුකම් ලබා තිබීම.

   හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ "තාක්ෂණික නොවන කළමනාකරණ කාණ්ඩයේ" (MA1-2) - II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය : JM 1-1 – 2016 – LKR 42 600 – 775 x 10 –1135 x 18 = 70 580**

### වයස :

අපේක්ෂකයන් වයස අවුරුදු 22 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### ස්ථිර කිරීම :

මෙම කාණ්ඩයේ II ශ්‍රේණියට පත් කරන ලද බාහිර අයදුම්කරුවෙකු, වැඩ භාරගැනීමෙන් පසු වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ ඔහුගේ / ඇයගේ කාර්ය සාධනය සහ හැසිරීම සතුටුදායක නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩ ඉම සම්පූර්ණ කළ විට ඔහු / ඇය පරිවාස කාලයෙන් පසු තනතුරේ ස්ථිර කෙරෙනු ඇත. අනුකූලතා ඇගයීම පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ දැනටමත් ස්ථිර කළ තනතුරක සිට අභ්‍යන්තර තෝරාගත් අපේක්ෂකයෙකු එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

### බඳවාගැනීමේ පටිපාටිය :

ලිඛිත තරගකාරී විභාගයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) - තනතුරු 01

### සුදුසුකම් :

**බාහිර :**

1. පහත විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය සහිතව එක් වරකදී අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් විෂයයන් හයක් සමත් වීම
   - i. සිංහල / දෙමළ
   - ii. ඉංග්‍රීසි භාෂාව
   - iii. ගණිතය

   සහ

2. අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් විද්‍යා, ගණිත, තාක්ෂණ හෝ වාණිජ්‍ය විෂය ධාරාවන් එකකින් එක් වරකදී විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හැර) සමත් වීම.

   සහ

3. පිළිගත් ආයතනයකින් පරිගණක යෙදුම් පිළිබඳ මාස 06 ක සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයන් :**

පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවක කාණ්ඩයේ - පුහුණු, ප්‍රාථමික මට්ටම - අර්ධ පුහුණු සහ ප්‍රාථමික මට්ටම - නුපුහුණු සේවකයන් හට අයදුම් කළ හැකි ය.

**අධ්‍යාපන :**

පහත විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය සහිතව අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් විෂයයන් හයක් සමත් වීම.

- i. සිංහල / දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව
- iii. ගණිතය

**වෙනත් :**

ඉහත සේවක කාණ්ඩයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

පිළිගත් ආයතනයකින් පරිගණක යෙදුම් පිළිබඳ මාස 06 ක සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය : MA 1-2 - 2016 – LKR 27,910 - 10x300 - 7x350 - 12x600 - 12x710 = 49,080**

### වයස :

අපේක්ෂකයන් වයස අවුරුදු 18 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### ස්ථිර කිරීම :

මෙම කාණ්ඩයේ III ශ්‍රේණියට පත් කරන ලද බාහිර අයදුම්කරුවෙකු, වැඩ භාරගැනීමෙන් පසු වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ ඔහුගේ / ඇයගේ කාර්ය සාධනය සහ හැසිරීම සතුටුදායක නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩ ඉම සම්පූර්ණ කළ විට ඔහු / ඇය පරිවාස කාලයෙන් පසු තනතුරේ ස්ථිර කෙරෙනු ඇත. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ දැනටමත් ස්ථිර කළ තනතුරක සිට අභ්‍යන්තර තෝරාගත් අපේක්ෂකයෙකු එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

### බඳවාගැනීමේ පටිපාටිය :

ලිඛිත තරගකාරී විභාගයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

### වෙනත් :

රජය විසින් අනුමත කර ඇති දීමනා ගෙවනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදලට 15% සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා 3% දායකත්වය ඇත. වෛද්‍ය රක්ෂණාවරණයකට හිමිකම් කියනු ලබයි (අග්‍රහාර).

### අයදුම්කරන පිළිවෙල :

සියලුම අයදුම්කරුවන් අපගේ නිල වෙබ් අඩවිය වන **www.slab.lk** හරහා අයදුම්පත්‍රය පිරවිය යුතු ය. මාර්ගගතව අයදුම් කිරීමෙන් අනතුරුව නිසි ලෙස සම්පූර්ණ කර බාගත් අයදුම්පත්‍ර **2021 ජූලි 28 දිනට පෙර** අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතු ය. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ දැක්විය යුතුය. වෙබ් අඩවියේ ඇති අයදුම්පත්‍ර බාගෙනගෙන, පරිගණකයෙන් සකසා මුද්‍රණය කළ අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කරුණාකර මාර්ගගතව අයදුම් කිරීමට පහත මාර්ගය අනුගමනය කරන්න නැතහොත් QR කේතය ස්කෑන් කරන්න.

**https://www.slab.lk/career/**

සභාපති
**ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**
අංක. 104/ ඒ, කිතුල්වත්ත පාර, බොරැල්ල.